# 1.42 මහායාන සම්ප්‍රදායේ ජාතක කථා පිළිබඳ විමර්ශනයක්

මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ
හින්දි අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

මහායාන සම්ප්‍රදායේ බිහි වීම සිදු වන්නේ හීනයාන සම්ප්‍රදායේ ම විකාසනයක ප්‍රතිඵලයක් වශයෙන් බව විද්වත් ලෝකයේ පිළිගැනීම යි. ඒ නිසා ම මෙම උභය සම්ප්‍රදායන්හි සමානකම් රාශියක් දක්නට ලැබෙයි. ඒ සමග ම සම්ප්‍රදායන් දෙකක් වශයෙන් විකාසනය වීමේ දී අසමානකම් ඇති නොවී තිබෙනු දැකිය නොහැකි ය. '**බෝධිසත්ත්ව සංකල්පය**' හීනයාන සම්ප්‍රදායේ නිර්මාණයක් බව පිළිගැනෙයි. බුදුදහම ප්‍රචලිත වීමත් සමග ම තත්කාලීන සමාජීය අවශ්‍යතාවන් අනුව එහි මූලික උද්දේශ්‍යයන්හි වෙනස්කම් ඇති වීම ස්වාභාවික තත්ත්වයකි. එහි ප්‍රතිඵලයක් ලෙස බුදුදහම තුළ '**භක්ති සංකල්පයක්**' පහළ වන්නට වූ අතර, '**බෝධිසත්ත්ව සංකල්පය**'ක් පිළිබඳ සාකච්ඡා ද සිදු වන්නට විය. ථෙරවාදී සම්ප්‍රදායේ '**ඛුද්දක නිකායෙහි**' ඇතුළත් '**බුද්ධවංශ**' නම් ග්‍රන්ථයෙහි ඉහත විෂය පිළිබඳ සාකච්ඡා කරනු දැකිය හැකි ය.

සකල බුද්ධ වචනය ම '**නවාංග සත්ථු ශාසන**' නමින් බෙදා වෙන් කොට ඇති බව ප්‍රකට කාරණයකි. මෙය මේ හා සම්බන්ධයෙන් දැක්වෙන පුරාණතම වර්ගීකරණය ලෙස සැලකෙයි. එහෙත්, මහායාන සම්ප්‍රදායේ මේ හා සම්බන්ධ වර්ගීකරණයන්හි විවිධතා දක්නට ලැබෙයි. මහාසාංඝික සම්ප්‍රදායේ විනය පිටකයෙහි මෙම වර්ගීකරණය පාලි ධර්ම ග්‍රන්ථවල ලෙසින් ම කොටස් 9කට බෙදා වෙන් කොට ඉදිරිපත් වෙයි. එහෙත්, ධර්මගුප්තක සම්ප්‍රදායේ '**දීර්ඝාගම**' සහ ධර්මගුප්තක විනය, සර්වාස්තිවාදී සම්ප්‍රදායේ '**මධ්‍යමාගම**' සහ '**සංයුක්තාගම**', මහීශාසක සම්ප්‍රදායේ '**මහීශාසක විනය**', මූලසර්වාස්තිවාදී සම්ප්‍රදායේ '**මූලසර්වාස්තිවාදී විනය**' ආදියෙහි ඉහත වර්ගීකරණය කොටස් දොළොසකින් යුක්ත වෙයි. ඉහත වර්ගීකරණ සලකා බැලීමේ දී යම් යම් අසමානකම් පෙනී යනවා පමණක් නොව සමහර අංග පිහිටවනු ලබන ස්ථානයන් පවා වෙනස් වී ඇති මෙහි දී පෙනී යන කරුණක් නම් පැරණි '**නවාංග**' වර්ගීකරණය වෙනස් කිරීමේ අවශ්‍යතාවක් මහායාන සම්ප්‍රදායට තිබුණු බව ය. එමෙන් ම සමහර විට හීනයාන සම්ප්‍රදායේ වර්ගීකරණයට වඩා වෙනස් වර්ගීකරණයක් මහායානයට තිබිය යුතු බව සිතූ නිසා විය හැකි ය.

දෙවන ධර්ම සංගායනාවත් සමග ම සංඝ ශාසනයෙහි ඇති වුණු මතභේද ආදිය නිසා මහායානයේ ආරම්භය සිදු වූ බව සාමාන්‍ය පිළිගැනීම යි. නිදහස් මතධාරී කණ්ඩායමක් ලෙස කටයුතු කළ '**මහාසාංගීතික**' හෙවත් '**මහාසාංඝික**' සම්ප්‍රදායේ භික්ෂූන් වහන්සේලා විසින් සංවිධානය කරන්නට යෙදුනු ධර්ම සංගායනාව '**මහාසංගීති**' නමින් හැඳින්විණි. මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කාරණයක් වන්නේ 10,000ක් භික්ෂූන් වහන්සේලා විසින් මෙම ධර්ම සංගායනාවේ දී බුද්ධ භාෂිත ධර්මය පිළිබඳ නව වර්ගීකරණයක් ඉදිරිපත් කරනු ලැබීම යි. ධර්ම ග්‍රන්ථ සංකලනය සම්බන්ධයෙන් සිදු කෙරුණු වෙනස්කම් අතර ජාතක කොටසට අයත් එක් කොටසක් ඉවත් කිරීම සම්බන්ධ තොරතුර මෙහි දී දක්නට ලැබෙන ඉතා වැදගත් කාරණයකි. එක් අතකින් මෙය ජාතකවල විකාසනය හා සම්බන්ධ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය. අනෙක් අතට මෙය මහායාන සම්ප්‍රදායේ '**ජාතක සම්ප්‍රදාය**'ට නව මාවතක් හෙළි කළ ප්‍රථම පියවර ලෙසින් ද හැඳින්විය හැකි ය.

මහායාන සම්ප්‍රදායේ ජාතක කථා පිළිබඳ විමර්ශනය කිරීම සඳහා භාරතය, චීනය, ලංකාව, ජපානය යන රටවල දකින්නට ලැබෙන මූලාශ්‍ර අධ්‍යයනය කිරීම මෙහි දී අපේක්ෂිත ය.